# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## උද්‍යාන අධීක්ෂක තනතුර [Garden Foreman] (කාන්තා / පුරුෂ)

**කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලයේ පවතින උද්‍යාන පාලක තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් / කාරිණියන් බඳවා ගැනේ.**

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු.
ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

අදාළ තනතුර දරන්නා පරිශ්‍ර යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සෘජුවම වාර්තා කල යුතුයි. එසේ ම නව තානාපති කාර්යාල පරිශ්‍රයේ පැළ, තණබිම්, ගස් සහ පඳුරු යනාදිය රැකබලාගැනීම සඳහා උද්‍යාන සේවකයන් 05 දෙනෙකු පමණ පුහුණු කර අධීක්ෂණය කිරීමත්, ඔවුන්ගේ විනය භාරව කටයුතු කිරීමත් සිදු කල යුතු ය. නිසි අයවැයක් සකසා ඒ අනුව වැඩ කටයුතු පවත්වාගෙන යා යුතු අතර මෙරට උද්‍යාන සේවා සපයන්නන් හා සබඳතා පවත්වා ගනිමින් උසස් තත්වයේ පැළෑටි ලබාගැනීමටත් සුන්දර ලෙස පරිශ්‍රය පවත්වාගැනීමටත් වගබලා ගත යුතුය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 82,050/- කි.**

### <u>අවශ්‍ය සුදුසුකම් :</u>

1 **අධ්‍යාපනය** - *ද්විතීයික අධ්‍යාපනය (අ.පො.ස. සාමාන්‍ය පෙළ පරීක්ෂණය සඳහා ගණිතය විෂයය ඇතුළුව විෂයයන් හයක් (6) සමත්ව තිබිය යුතු අතර, අවම වශයෙන් විෂයයන් තුනක් (3) සඳහා විශිෂ්ට සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය)* සම්පූර්ණ කර තිබිය යුතු අතර අවම වශයෙන් වසරක උද්‍යාන පාලන, බිම් සැකසීම් සහ කෘෂිකර්මය පිළිබඳ වසරක පාඨමාලාවක් හදාරා තිබිය යුතුය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

2 **පූර්ව රැකියා පළපුරුද්ද** - උද්‍යාන පාලනය, බිම් සැකසීම, කෘෂිකර්මය සහ පැළ වැවීම පිළිබඳ තුන් වසරක ආයතනික සේවා පළපුරුද්දක් සහ එම සේවා කාලය ඇතුලත අධීක්ෂක තනතුරක වසරක පළපුරුද්දක් තිබිය යුතුය. **(අදාළ සේවා / ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

3 **භාෂා ප්‍රවීණතාවය** - II වන මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කතා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ **(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
එසේම III වන මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල සහ / හෝ දෙමළ කියවීම, ලිවීම සහ කතා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4 **නිපුණතා සහ හැකියාවන්** - වගා සඳහා බිම් සැකසීමේ කුසලතාව සහ විශාල ශ්‍රම බලකායක් අධීක්ෂණය කිරීමේ හැකියාව තිබිය යුතුය. එසේම තනතුර දරන්නා විසින් අතින් සහ විදුලියෙන් ක්‍රියාකරන තණකොළ කැපීමේ යන්ත්‍ර, කප්පාදු කිරීමේ උපකරණ, කියත්, වල් පැළෑටි ඉවත් කිරීමේ උපකරණ ඇතුළු අදාළ බල මෙවලම් භාවිතා කිරීමේ හැකියාව තිබිය යුතුය. මනා රිය ධාවන වාර්තාවක් සහිතව **"B"** පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් 'C','C1' කාණ්ඩ) තිබිය යුතු වේ. **(සුරක්ෂිතව රිය පැදවීමේ හැකියාව පරීක්ෂා කෙරෙනු ඇත) රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතුය.**

### <u>අයදුම් කරන ආකාරය :</u>

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවාගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න.

ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**<u>තැපැල් හෝ ඊමේල් මගින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.</u>**

ඔබගේ අයදුම්පත 2021 ජූලි 28 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.